**නෝර්ත් සී ලිමිටඩ් - 2015/2016**

**-------------------------------------**

නෝර්ත් සී ලිමිටඩ් හි 2016 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මෙම වාර්තාව නිකුත් කරනු ලැබේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම

**--------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හා වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

**--------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පටිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පටිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්වය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිත උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සමාගමේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශන සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**----------------------------------------**

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 20 හි පරිච්ඡේද අංක 39(අ) හා (ආ) අනුව මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගත් රජයේ ප්‍රදාන හා රජයේ ආධාර (Government Assistance) සඳහා වූ ගිණුම්කරණයේදී ගිණුම් ප්‍රතිපත්තිය ඇතුළත්ව රීති, ස්වභාවය හා රජයේ ප්‍රදානවල ප්‍රමාණය සමාගම විසින් හෙළිදරව් කළ යුතු වේ. කෙසේ වුවත්, වාර්තාකරණ කාලපරිච්ඡේදය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගත් රජයේ ප්‍රදානවල ස්වභාවය හා රජයේ ප්‍රදාන ප්‍රමාණය ගිණුම්ගත කිරීමේ ප්‍රතිපත්තිය සමාගම විසින් අනාවරණය කර නොතිබුණි. තවද, ඉදිරියට ගෙන එන ලද

රු.72,478,172 ක රජයේ ප්‍රදාන හා රඳවාගත් ඉපයීම්වලට එරෙහිව රු.14,029,065 ක හානිකරණයක් වාර්තාකරණ කාලපරිච්ඡේදය සඳහා වූ වෙනත් ආදායම් ප්‍රදානවල ස්වභාවය සැලකීමකින් තොරව සිදුකර තිබුණි.

(ආ) 2000/ 2001 මුදල් වර්ෂයේදී සී නෝර් පදනමින් රු.6,300,000 ක් වටිනා යන්ත්‍ර සමාගම විසින් පවරා ගෙන තිබුණි. කෙසේ වුවත්, මෙම යන්ත්‍ර වත්කමක් ලෙස භාවිතා කර නොතිබුණු අතර ඒ අනුව ක්ෂය කිරීමද සිදු කර නොතිබුණි. මේ අතරතුර 2015/2016 වර්ෂයේදී මෙහි ප්‍රයෝජනවත් ආර්ථික ජීව කාලය තක්සේරු කිරීමකින් තොරව වත්කමක් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ඇ) ඉදිරියට ගෙන එන ලද රු.3,666,704 ක බදු පොලී අවිනිශ්චිත ශේෂයෙහි වරද හඳුනාගැනීම වෙනුවට සමාලෝචිත වර්ෂයේදී වියදමක් ලෙස සලකා තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස සමාලෝචිත වර්ෂයේ ලාභය ඊට සමාන ප්‍රමාණයකින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඈ) රු.1,267,032 ක අවිනිශ්චිත ගිණුමේ ශේෂය සමාලෝචිත වර්ෂයේදීවත් වරද හඳුනා ගැනීමකින් තොරව සමාගමේ ගිණුම් පොත්වල පැවතුණි.

(ඉ) 2007 අංක 07 දරන සමාගම් පනතේ 220 වැනි වගන්තිය ප්‍රකාරව සමාගම විසින් අතිවිශේෂ මහා සභා රැස්වීමක් පවත්වා නොතිබුණි. එසේ වුවත්, සමාගමේ ශුද්ධ වත්කම් සමාලෝචිත ගිණුම් කාල පරිච්ඡේදය අවසානයට රු.52,144,084 ක ඍණ ශේෂයක් කරා ළඟා වී තිබුණි. මේ අනුව සමාගම දිගින් දිගට පැවතීමේ හැකියාව සැකසහිත බව අනාවරණය විය.

(ඊ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 01 - මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම, ප්‍රමිතයේ සඳහන් ප්‍රතිපාදන අනුව අස්ථිත්වයක් විසින් උපචිත පදනම මත මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතු වේ. කෙසේ නමුත්, ඊට පටහැනිව සමාගම විසින් මුදල් පදනම මත වෙනත් ආදායම් හඳුනාගෙන තිබුණි. තවද, මෙම ප්‍රමිතයේ අවශ්‍යතාවය පරිදි ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනයේ හා මුදල් ප්‍රවාහවල සංසන්දනාත්මක තොරතුරු හෙළිදරව් කිරීමට සමාගම අසමත් වී තිබුණි.

(උ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 17 - බදු

වාර්තාකරණ කාලපරිච්ඡේදය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවල පහත සඳහන් තොරතුරු හෙළිදරව් කර නොතිබුණි.

(i) වාර්තාකරණ කාලපරිච්ඡේදය අවසානයට එකතු අනාගත අවම බදු ගෙවීම් හා එහි වර්තමාන අගය අතර සංසන්දනය කිරීමක්

(ii) වාර්තාකරණ කාලපරිච්ඡේදය අවසානයට එකතු අනාගත අවම බදු ගෙවීම්

(ඌ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 19 - සේවක ප්‍රතිලාභ

අර්ථ කර දැක්වූ විශ්‍රාමික ප්‍රතිලාභ බැඳීම ආයු ගණක අගය කිරීමේ පදනම යොදා ගනිමින් මැනීම සිදුකළ යුතුවේ. කෙසේ වුවත්, පාරිතෝෂික වෙන්කිරීම මැනීම සඳහා සමාගම විසින් මෙම ක්‍රමය අනුගමනය කර නොතිබුණි. තවද, සමාගම විසින් විශ්‍රාමික ප්‍රතිලාභ බැඳීම් සඳහා වත්කමක් ස්ථාපිත කිරීමට සැලසුම් කර නොතිබුණි.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

තත්ත්වාගණනය කළ මතය සඳහා වූ ඡේදයේ දක්වා ඇති කරුණුවලින් හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2016 මාර්තු 31 දිනට නෝර්ත් සී ලිමිටඩ් හි මූල්‍ය තත්ත්වය හා මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ වාර්තාකරණ කාලපරිච්ඡේදය අවසානයට ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.1.2 වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2007 අංක 07 දරන සමාගම් පනතේ 163 (2) වගන්තිය ප්‍රකාරව මා විසින් පහත සඳහන් කරුණු දක්වමි.

(අ) තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම සහ විගණනයේ විෂය පථය සහ සීමා කිරීම් ඉහත දක්වා ඇති පරිදි වේ.

(ආ) මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම ඡේදයේ දක්වා ඇති කරුණුවල බලපෑම හැර, විගණනය සඳහා අවශ්‍ය සියළුම තොරතුරු හා පැහැදිලි කිරීම් ප්‍රමාණවත් ලෙස ලබාගෙන ඇති අතර මාගේ පරීක්ෂණවලින් පෙනී යන අන්දමට සමාගම විසින් විධිමත් ලෙස ගිණුම් වාර්තා හා පොත්පත් පවත්වා ගෙන ගොස් ඇති බවත්

- සමාගමේ මූල්‍ය ප්‍රකාශන 2007 අංක 07 දරන සමාගම් පනතේ 151 වගන්තියේ අවශ්‍යතාවයන්ට අනුකූල වන බවත් මා දරන්නා වූ මතය වේ.

### 2.2 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට ණයගැති ශේෂ 30 ක එකතුව වූ රු.11,631,108 ක් වර්ෂ එකකට වැඩි කාලයක් අයකර ගැනීමකින් තොරව හිඟ හිටව පැවතුණි.

(ආ) රජයේ ආයතනවලින් ලබාගත් ණය ශේෂ දෙකක එකතුව රු.3,000,000 ක් හා ණයහිමි ශේෂ හතක එකතුව රු.25,908,608 ක් පිළිවෙලින් වර්ෂ 10 කට වඩා හා වර්ෂ එකක් නිරවුල් කිරීමකින් තොරව හිඟ හිටව පැවතුණි.

### 2.3 නීති, රීති හා රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

පහත සඳහන් නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති, රීති හා රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම් |
| --- | --- |
| (අ) 2002 අංක 14 දරන එකතු කිරීමේ අගය මත බදු පනත 21(1) හා 67(එෆ්) දරන වගන්ති | සමාගම විසින් අගය එකතු කිරීමේ බදු රු.93,101,473 ක් නොගෙවීමත් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට අගය එකතු කිරීමේ බදු වාර්තා 2010 වර්ෂයේ සිට ඉදිරිපත් කිරීමද සිදු කර නොතිබුණි. ඒ නිසා ඒ සඳහා දඩ මුදල් ලෙස රු.30,983,483 ක් |

| | | |
|---|---|---|
| | | ගෙවීමට සිදු වී තිබුණි. |
| (ආ) | 2006 අංක 13 දරන ආර්ථික සේවා ගාස්තු පනත 06 වගන්තිය | සෑම කාර්තුවකටම පසුව එළැඹෙන මාසයේ 20 වැනි දිනට පෙර මුදල් ප්‍රේෂණය කළ යුතු වුවත් 2015/2016 තක්සේරු වර්ෂය සඳහා රු.3,141,513 ක් වූ ආර්ථික සේවා ගාස්තුව දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට 2017 දෙසැම්බර් 5 දින වන විටත් ප්‍රේෂණය කර නොතිබුණි. |
| (ඇ) | 2006 අංක 10 දරන දේශීය ආදායම් පනත | |
| | (i) 25, 26 හා 32 දරන වගන්ති | සමාගම එහි ව්‍යාපාර මෙහෙයුම් කටයුතුවලින් ගිණුම්කරණ අලාභයක් ලබා තිබුණත් බදු පරමාර්ථ සඳහා බදු අයකළ හැකි ලාභ හෝ පාඩු ගණනය කිරීම අවශ්‍ය කෙරේ. කෙසේ වුවත්, සමාලෝචිත වර්ෂය සඳහා වූ අලාභය බදු පරමාර්ථය සඳහා ගැලපුම් කර නොතිබුණි. |
| | (ii) 106 වගන්තිය | නියමිත දිනය ඇතුළත ආදායම් බදු වාර්තා දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කිරීමට සමාගම අසමත් වී තිබුණි. |
| | (iii) 136 වගන්තිය | රඳවා ගැනීමේ බදු මත පොලී ආදායම බදු බැර සඳහා ගැලපුම් කර නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

---------------------

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

-------------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ සමාගමේ මෙහෙයුම් කටයුතුවලින් වූ ප්‍රතිඵලය රු.77,646,604 ක අලාභයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අලාභය රු.51,232,870 ක් විය. සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය තවදුරටත් රු.26,413,734 කින් පිරිහීමක් මෙලෙස දැක්වුණි. විකුණුම් පිරිවැය හා කම්හල් මෙහෙයුම් පිරිවැය වැඩිවීම හා අවිනිශ්චිත ලෙස හඳුනාගත් බදු පොලී වියදමක් හඳුනාගැනීම මෙම මූල්‍ය ප්‍රතිඵලයේ පිරිහීම කෙරෙහි ප්‍රධාන ලෙස බලපා තිබුණි.

### 3.2 විශ්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

----------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පසුගිය වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ ආදායම සියයට 45 කින් පහත වැටී තිබුණි.

(ආ) පසුගිය වර්ෂයේ සමාගමේ මුළු ජංගම නොවන වත්කම් රු.මිලියන 201.67 සිට රු.මිලියන 189.48 දක්වා සමාලෝචිත වර්ෂයේදී අඩු වී පසුගිය වර්ෂයේ වූ දිගුකාලීන වගකීම් රු.මිලියන 42.663 සිට රු.මිලියන 69.165 දක්වා සමාලෝචිත වර්ෂයේදී වැඩි වී තිබුණි.

(ඇ) පසුගිය වර්ෂයේ සමාගමේ සෘණ දළ ලාභ අනුපාතය සියයට 3.7 සිට සියයට 24 දක්වා සමාලෝචිත වර්ෂයේදී තවදුරටත් පිරිහී තිබුණි. සමාගමේ මුළු ආදායමින් එහි විකුණුම් පිරිවැය තවදුරටත් අයකරගත නොහැකි බව මෙමඟින් නිරූපනය කෙරේ.

## 4. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය

### 4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය අනුව මුදල් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත කෙටුම්පත් වාර්ෂික වාර්තාව හා මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා ඉදිරිපත් කර තිබුණේ 2018 ජනවාරි 10 දිනදීය.

### 4.2 අභ්‍යන්තර විගණනය හා විගණන සහ කළමනාකරණ කමිටුව

2016 ජනවාරි 28 දිනැති අංක DMA/Cir-edit දරන කළමනාකරණ විගණන දෙපාර්තමේන්තු චක්‍රලේඛය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය තුළදී සමාගම විසින් විගණන කමිටු රැස්වීම් පවත්වා නොතිබුණි. තවද, සමාගමේ මෙහෙයුම් කාර්යක්ෂමතාවය සහතික වීම හා සමාගමට අයත් කම්හල්වල අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි.

## 5. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර සමාගමේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍රය | නිරීක්ෂණයන් |
|---|---|---|
| (i) | ණයගැතියන් හා ණයහිමියන් පිළිබඳ පාලනය | ණයගැතියන්ගේ හා ණය හිමියන්ගේ දීර්ඝ කාලීන හිඟ හිටි ශේෂ පැවතීම. |
| (ii) | මූල්‍ය පාලනය | සමාගමේ ගිණුම් පොත්වල වර්ෂ 03 ක් හෝ ඊට වඩා වැඩි කාලයක සිට පවතින නොවිසඳු අවිනිශ්චිත ශේෂ පැවතීම. |
| (iii) | පොදු ලෙජරය පවත්වා ගෙන යාම | අනුමත නොකළ කටු සටහන් ගිණුම් විවෘත කිරීම සඳහා අවස්ථාව තිබීම. |